විවිධ තරු මට්ටමේ ජනප්‍රිය පුද්ගලයින් හා සිදුකරනා පුවත්පත් සාකච්ඡාවන් හි ඇසෙනා ප්‍රශ්න ස්ත්‍රී පුරුෂ භාවය හා වෙනස් වන ආකාරය අප මින් පෙරද පෙන්වා දී ඇත්තෙමු. මෙහිදී විශේෂයෙන්ම කාන්තාවක් හා සිදුකෙරෙන සාකච්ඡාවකදී, ඇයගේ වෘත්තියට පෙම්වතාගෙන් බලපෑම් තිබේද, ඔහු වාරණ පනවන්නේ නැතිද, විවාහයෙන් පසු වෘත්තිය ජීවිතයට සමු දෙන එකක් නැහැ නොවේද වැනි ප්‍රශ්න ඇසෙනු දැකිය හැක.

එසේම එවන් ප්‍රශ්න පිරිමින්ගෙන් නොඇසෙනුද දැකිය හැක. මෙවැනි ප්‍රශ්න ඔස්සේ සිදුවන්නේ කාන්තාව වෘත්තිය පසෙක ලා ගෘහ ජීවිතයට මුල් තැන ලබාදිය යුතුය යනුවෙන් වන සාම්ප්‍රදායික ඒකාකෘතික කිරීම තවදුරටත් සමාජගත කිරීම නොවේද? මෙවැනි ප්‍රශ්න මගින්, තම වෘත්තිය ජීවිතයේ කෙතරම් ඉහළට යන කාන්තාවක් වුවත්, වෘත්තිය ජීවිතය පවත්වා ගෙන යෑම හෝ ඊට සමුදීම පිළිබඳව පෙම්වතාගේ/ස්වාමි පුරුෂයාගේ කැමැත්තට ඉඩ දිය යුතු බවක් හැඟවෙන්නේ නැතිද?

ඒ ඔස්සේ ඇයට වෙනස් ලෙස සැලකීමක් සිදුවන්නේ නැතිද? මේ පිළිබඳව ඔබේ අදහස කුමක්ද?
#MediaEthicsSL #lka #SinhalaPress #Mawbima #Hadagasma